# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2002 අංක 3 දරන නිසි බලධාරී (බලතල හා කර්තව්‍ය) පනත

---

**[සහතිකය සටහන් කළේ 2002 මාර්තු මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 7.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 4.50 යි.**

# 2002 අංක 3 දරන තිසි බලධාරී (බලතල හා කර්තව්‍ය) පනත

[සහතිකය සටහන් කළේ 2002 මාර්තු මස 25 වන දින]

එල්.ඩී.—ඕ. 5/2002.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද තිසි බලධරයාගේ බලතල සහ කර්තව්‍ය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 3 දරන තිසි බලධාරී (බලතල හා කර්තව්‍ය) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කළමනාකරණය භාරගැනීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ ව්‍යවස්ථාවේ (5) වන ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ පත් කරන ලද (මෙහි මින් මතු "තිසි බලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තිසි බලධරයා විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම කළ යුත්තේ ය :— තිසි බලධරයාගේ බලතල හා කර්තව්‍ය.

(අ) අවස්ථාවෝචිත පරිදි ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශන සේවය, මහජන යහපත පිණිස සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක්, ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට හැකිවනු පිණිස, වැඩ සටහන් සම්පාදනයෙහි උසස් ප්‍රමිතියක් සහිතව පවත්වාගෙන යාම ;

(ආ) අවස්ථාවෝචිත පරිදි මැතිවරණයක්, ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් හා සම්බන්ධ රූපවාහිනී හෝ ගුවන් විදුලි වැඩ සටහන් විකාශනය කිරීම අරමුණු කොට නිෂ්පාදනයෙහි නිරතව සිටින තැනැත්තන් ලියාපදිංචි කිරීම ;

(ඇ) අවස්ථාවෝචිත පරිදි මැතිවරණයක්, ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් සම්බන්ධව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් හෝ විකාශනය කරන වැඩ සටහන් පිළිබඳව අධීක්ෂණයක් හා පාලනයක් පවත්වා ගැනීම ;

(ඇ) මැතිවරණයක්, ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් සම්බන්ධව, කරනු ලබන විකාශන සම්බන්ධ කාරණා පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ඈ) අවස්ථාවෝචිත පරිදි මැතිවරණයකට, ඡන්ද විමසීමකට හෝ ජනමත විචාරණයකට අදාළ යම් විකාශනයක් හා සම්බන්ධව, පිළිවෙලින් 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි පනතින් හෝ 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතින් හෝ අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට පිරිනමා ඇති, පනවා ඇති හෝ පවරා ඇති සියලුම බලතල ක්‍රියාවේ යෙදීම හෝ ඉටු කිරීම ;

(ඉ) විකාශන උපකරණ ස්ථාපනය කිරීම, සවිකිරීම සහ ක්‍රියාකරවීම ;

(ඊ) ගොඩනැගිල්ලක් ඇතිව හෝ නොමැතිව යම් ඉඩමක් හෝ ඉඩමකට යම් අයිතියක්, බද්දක්, අතුරු බද්දක් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම ;

(උ) යම් විකාශන ස්ථානයක් හා සම්බන්ධව හෝ නිසි බලධරයාගේ බලතල ක්‍රියාවේ යෙදීම සහ කර්තව්‍ය ඉටු කිරීම හා සම්බන්ධව ප්‍රයෝජනයට ගැනීම සඳහා, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හෝ අයත් නැතහොත් ඒ යම් සංස්ථාවක් විසින් පරිපාලනය කරනු ලබන යම් ඉඩමක යම් විකාශන උපකරණ හෝ යම් ගොඩනැගිල්ලක් නැතහොත් නිර්මාණයක් ඉදිකිරීම, වෙනස් කිරීම හෝ නැවත ඉදි කිරීම ;

(ඌ) නිසි බලධරයා පත් කරනු ලැබ ඇති කාලසීමාව ඇතුළත, ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සැලකෙන යම් දේපළ, අයිතිවාසිකම් හෝ වරප්‍රසාද, බද්දක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම ;

(එ) අවස්ථාවෝචිත පරිදි මැතිවරණයකට, ඡන්ද විමසීමකට හෝ ජනමත විචාරණයකට අදාළව වෙනත් යම් ව්‍යාපාරයක් සමග එක්ව හෝ නොඑසේව, විකාශනය සඳහා වැඩ සටහන් නිෂ්පාදනය කරන හෝ නිෂ්පාදනය කිරීමට අදහස් කරන යම් තැනැත්තකුට හෝ සංස්ථාගත

කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයකට, මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ඇතිව හා ඒ සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් නියමයන් හා කොන්දේසිවලට යටත්ව මුදල් අත්තිකාරම් දීම හෝ දෙවන තැනැත්තකු විසින් ඉහත කී පරිදි එවැනි යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට දෙනු ලබන යම් අත්තිකාරමක් වෙනුවෙන් යම් සහතිකවීමක්, හානි පූරණයක් හෝ ඇපයක් සැපයීම ;

(ඔ) යම් මැතිවරණයකට, ඡන්ද විමසීමකට හෝ ජනමත විචාරණයකට අදාළ යම් විකාශනයක් ප්‍රවර්ධනය කිරීමේ සහ ඒ යම් විකාශනයකට සහාය වීමේ කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට අයත් පහසුකම් හා උපකරණ, සුදුසු යයි තිසි බලධරයා සලකන යම් ආකාරයකට ප්‍රයෝජනයට ගැනීම ;

(ඕ) තිසි බලධරයා පත්කරනු ලැබ ඇති කාලසීමාව ඇතුළත, නිවාස සහ භූමි, බද්දට හෝ කුලියට ගෙන, එම බලධරයා විසින් පත් කරන ලද නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා නිවාස ඉදිකිරීම ;

(ක) අවශ්‍ය යයි හෝ වැඩදායක යයි තිසි බලධරයා සලකන වාර ප්‍රකාශන හෝ වෙනත් ප්‍රකාශන පළකිරීම හෝ පළකරවීමට කටයුතු පිළියෙල කිරීම ;

(ග) රූපවාහිනීගත කිරීම, පටිගත කිරීම හෝ විකාශනය මහජන යහපත පිණිස නොවන කවර හෝ ස්වරූපයකින් වන ප්‍රචාරක දැන්වීමක් රූපවාහිනීගත කිරීම, පටිගත කිරීම හා විකාශනය ප්‍රතික්ෂේප කිරීම ;

(ච) මේ වගන්තියේ නිශ්චිතව සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට හෝ කර්තව්‍ය ඉටු කිරීම සඳහා, ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක යම් තැනැත්තකු හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් සමග ඒකාබද්ධව හෝ එක්ව ක්‍රියාකිරීම ; සහ

(ඡ) තිසි බලධරයාගේ මතය අනුව අවස්ථාවෝචිත පරිදි නිදහස් හා සාධාරණ මැතිවරණයක්, ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා හෝ දේ කිරීම.

ඇතැම් කොන්දේසි ඉටු කරන බවට තිසි බලධරයා සෑහීමට පත්විය යුතු බව.

**3.** 2 වන වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේද යටතේ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් හෝ විකාශනය කරන වැඩ සටහන්, මැතිවරණ කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි යම් උපමානවලට අමතරව පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන බවට, ප්‍රායෝගිකව හැකිතාක් දුරට සෑහීමට පත්වීම, තිසි බලධරයාගේ කාර්යය විය යුත්තේ ය :-

(අ) අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විකාශනය කරන යම් වැඩ සටහනක ශිෂ්ටභාවයට හෝ විනීතභාවයට පටහැනි කිසිවක් හෝ යමකු අපරාධයක් සිදු කිරීමට පොළඹවන යමක් හෝ අවුල් වියවුල් ඇති කිරීමට තුඩු දෙන නැතහොත් යම් ජනවාර්ගික හෝ ආගමික තම්‍යතාවකට අහිතකර කිසිවක් හෝ මහජන හැඟීම්වලට අවමන් සහගත කිසිවක් හෝ ඇතුළත් නොවන බවට ;

(ආ) එම විකාශනය වන වැඩ සටහන්වලට විෂය වී ඇති කාරණා සම්බන්ධයෙන් තිසි ප්‍රාදේශීය, දේශීය හා ජාත්‍යන්තර සමතුලිතතාවක් පවත්වාගන්නා බවට සහ පොදුවේ උසස් මට්ටමක ගුණාත්මකභාවයක් පවත්වා ගන්නා බවට ;

(ඇ) එවැනි වැඩ සටහනකින් ඉදිරිපත් කරන ප්‍රවෘත්ති නිවැරදිතාවයෙන් හා අපක්ෂපාතිත්වයෙන් යුතුව හා මහජන යහපත පිළිබඳව තිසි සැලකීමක් ඇතිව ඉදිරිපත් කරන බවට.

තිසි බලධරයාට එරෙහිව වන සිවිල් හෝ අපරාධ නඩුපැවරීමක් රජය විසින් හෝ රජයට එරෙහිව නඩු පැවරීමක් ලෙස සැලකිය යුතු බව.

**4.** මේ පනත යටතේ තිසි බලධරයා වෙත පැවරී තිබෙන බලතල හා කර්තව්‍ය ඉදිරියට ගෙන යාමේ දී, කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් තිසි බලධරයාට එරෙහිව හෝ තිසි බලධරයා විසින් හෝ අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නඩුකරයක්, රජයට එරෙහිව රජය විසින් හෝ පවරන ලද නඩුවක් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

**5.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන්, තිසි බලධරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර එසේ පත් කරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු රජයේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

නිලධරයන් හා සේවකයන්.

**6.** තිසි බලධරයාට සහ මේ පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට, මැතිවරණ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයන් අනුව ආගණනය කළ පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි අතර එම පාරිශ්‍රමික, ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

තිසි බලධරයාගේ පාරිශ්‍රමික.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි –

අර්ථ නිරූපණය.

"විකාශනය" යන්නෙන්, රූපවාහිනී හෝ ශ්‍රව්‍ය විදුලි විකාශනයක් අදහස් වන අතර, ඊට මහජනයා විසින් ප්‍රතිග්‍රහණය කරනු ලැබීම සඳහා විකාශනය කරන යම් සංඥාවක්, ප්‍රකාශනයක්, අංගයක්, සන්නිවේදනයක්, රූපයක් හෝ වෙනත් දෙයක් ඇතුළත් වේ ;

"මැතිවරණ කොමිෂන් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මැතිවරණ කොමිෂන් සභාව අදහස් වේ ; සහ

"උපමාන" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(5)(ඇ) ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරන උපමාන අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.